Buddhist Era 2545 Poson Second Quarter - Tuesday July 2, 2002



## පොසොන් උදවේ මිහින්තලාවයි දිළුණු ලතාවයි

### ⁘ නිවැරැදි දිවියක තිබිය යුතු සැප

– දෙරොව්වේ ඤාණරතන හිමි

පොසොන් අව අටවක පොහෝද ධර්ම දේශනාව යටතේ සැපත සෙවීම පිළිබඳ මනුෂ්‍යයා තුළ පවතින උවමනාව නිවැරැදි මගට යොමු කරන බෞද්ධ ප්‍රතිපදාව තුළ දැක්වෙන වඩාත් නිරවුල්, නිවැරැදි ජීවිතයක් සඳහා ලබාගත යුතු සැප සම්පත් පිළිබඳ ධර්මානුකූල විමර්ශනයකි.

### ⁘ මහින්දාගමනය කලින් සැලසුම් කරන ලද්දකි

– මහාචාර්ය මැන්දිස් රෝහණදීර

මහා මහින්ද මහ රහතන් වහන්සේගේ ලංකා ගමනයට පසුබිම් වූ ඓතිහාසික සිදුවීම් මාලාව. භාරතයේ විසූ අශෝකාධිරාජයා හා ශ්‍රී ලංකාවේ විසූ දේවානම්පියතිස්ස මහ රජු අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික හා පෞද්ගලික සබඳතා.

### ⁘ බෞද්ධ ආර්ය මාර්ගයේ මනෝ විද්‍යාත්මක පදනම

ජීවිතය පිළිබඳ නිවැරැදි දැක්මක්–ජීවන දර්ශනයේ ඇති වන වෙනසක්–පැහැදිලි බවක් තුළින් ඇරැඹෙන බෞද්ධ ආර්ය (උතුම්) මාර්ගයෙහි (ජීවන පිළිවෙතෙහි) ගමන් කරන්නා තුළ සිදුවන ආධ්‍යාත්මික විපර්යාසය පිළිබඳ මනෝ විද්‍යාත්මක විග්‍රහයකි.

### ⁘ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ

‘ශ්‍රාවක චරිත’ විශේෂාංගය යටතේ භාරතයේ විසූ අශෝකාධිරාජයාගේ දායකත්වයෙන් ඇරැඹුණු–ඓතිහාසික මහා ධර්ම සංගායනාවෙහි මූලසුන හෙබැවූ ‘මොග්ගලීපුත්තතිස්ස’ නම් වූ මහ ස්ථවිරයන් වහන්සේගේ චරිතාපදානයේ සුවිශේෂත්වය.

### ⁘ නොසැලෙන සිතක අසිරිය

–හොරොව්පොතානේ සතින්ද්‍රිය හිමි

බෞද්ධ විමුක්ති මාර්ගයට පිවිසුණු පුද්ගලයා තුළ සිදුවන ආධ්‍යාත්මික පෙරැළියේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන අටලෝ දහමෙහි නොසැලෙන ගුණය.

### ⁘ සිහිපත් කළ යුතු පොසොන් අරුත

–මුතුමානි රාජහෙට්ටි

අනුබුදු මිහිඳු හිමියන්ගේ ලංකා ගමනය නිසා සිදු වූ අති විශාල චින්තන හා සමාජ විප්ලවය තුළ සැඟවුණු–සිහිපත් කළ යුතු දර්ශනික අරුත.

### ⁘ පහන් පූජාවේ අනුසස්

ලේක්හවුස් ආයතනය හා ලංකා විදුලිබල මණ්ඩලය සම අනුග්‍රහයෙන් පවත්වනු ලබන මිහින්තලා ආලෝක පූජාව නිමිත්තෙන් ලියැවුණු විශේෂ ලිපියකි. ආලෝක පූජාවෙන් විමුක්තිලාභියාගේ ප්‍රඥාව සංකේතවත් වන ආකාරය සහ ආලෝක පූජාවේ කර්මානුකූල ආනිශංස විග්‍රහ කෙරෙන ලිපියකි.

### ⁘ ඇහැලියගොඩ තොරණගොඩ පුරාණ ගල්ලෙන් විහාරය

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රදේශයට අයත් තොරණගොඩ පිහිටි ඉපැරැණි–ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු–‘සිත නිවෙන තැන්’ විශේෂාංගය යටතේ.

### ⁘ Bodhisatta Setaketu down to earth

*-by Aryadasa Ratnasinghe*